# අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳ වාස්තුවිද්‍යාත්මක විමර්ශනයක්

**එච්.ඒ.එස්.එම්. හෙට්ටිආරච්චි[1]**

**ප්‍රමුඛ පද:** පත්තිනි දේවාලය, මහනුවර යුගය, අම්බලම, චිත්‍ර සම්ප්‍රදාය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උඩසියපත්තුවේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය පිහිටා ඇත. මෙම දේවාලය පත්තිනි දේවිය වෙනුවෙන් පුද පූජා පවත්තනු ලබන දෙවොලකි. ඓතිහාසික අම්බොක්ක ශ්‍රී පත්තිනි මහා දේවාලය දරුඵල නැති කාන්තාවන්ට දරුඵල ලබා ගැනිමට පත්තිනි දේව මෑණියන්ගේ පිහිට ලැබෙන හාස්කම් ඇති දේවාලයක් ලෙස මාතලේ පුරවරයේ හා අනෙකුත් ප්‍රදේශවල ප්‍රසිද්ධියක් උසුලන දේවාලයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. පළමු ගජබාහු රජුගේ දකුණු ඉන්දීය ආක්‍රමණයේදී ලක්දිවට සොළී දේශයෙන් විසිහතර දාහක් පමණ සිරකරුවන් ද පාත්‍ර ධාතූන් වහන්සේ සහ පත්තිනි මෑණියන්ගේ රන් සළඹ ගජබාහු රජු විසින් ලක්දිවට ගෙන ආ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. අතීතයේ මිල්ලවාන නමැති ගමෙහි ගම්මුන් විසින් මී කැඩීමට යන අවස්ථාවේ මිල්ල ගසක තිබී පත්තිනි දේව සළඹ හමු වී ඇත. ඉන් පසුව මෙම මිල්ල ගහ යට පත්තිනි දේවාලයක් ඉදි කොට පුද පූජා පවත්වන ලදී. මෙලෙස පුද පූජා පවත්වන අතරතුර සෑම අවුරුද්දකම එම දේවාලයේ රාජකාරි ඉටු කරන ලද පවුලේ අය මිය යාමට පටන් ගෙන තිබේ. ඒ අතර අවසාන වරට රාජකාරි සිදු කරන ලද කපු මහතාට එම පත්තිනි හළඹ අම්බොක්ක වෙත වැඩමවා එහි දේවාලයක් කරවා පුද පූජා පැවැත්වීමට කටයුතු සැලැස්විය යුතු බවට සිහිනෙන් පවසා ඇත. එම නිසා මෙම පත්තිනි දේව සළඹ මහා පෙරහැරකින් මිල්ලවාන ග්‍රාමයේ සිට අම්බොක්කට වැඩමවා එහි දේවාලයක් ඉදි කොට සළඹ තැන්පත් කර ඇති බවට ජනප්‍රවාදයේ සඳහන් වේ. ඒ අනුව මෙම ඓතිහාසික අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳව වාස්තුවිද්‍යාත්මක විමර්ශනයක් සිදු කිරිම මෙම අධ්‍යයනය තුළින් අරමුණු කරනු ලබයි.

## ක්‍රමවේදය

අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳ මූලික අවබෝධයක් ක්ෂේත්‍ර අධ්‍යයනය කොට දේවාලයෙහි රාජකාරි කරන ප්‍රධාන කපු මහතාගෙන් සහ සෙසු කපු මහතුන්ගෙන් ලබා ගන්නා ලද අතර අවශ්‍ය වෙනත් පසුබිම් තොරතුරු සඳහා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. එසේම මෙම දේවාලය පිළිබඳ ලියවී ඇති පුවත්පත් වාර්තා ද අධ්‍යයනයට ලක් කොට අවශ්‍ය තොරතුරු ලබා ගෙන එහි ඇති වාස්තුවිද්‍යාත්මක අංග පරීක්ෂාවට ලක් කොට ඡායා පිටපත් ද රැගෙන තොරතුරු මනා ලෙස විශ්ලේෂණය කොට අවසන් නිගමනයට එළඹිණි.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
maduwanshashikala@gmail.com

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ දේව ඇදහිලි අතර පත්තිනි දේව ඇදහිල්ලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මාතලේ දිස්ත්‍රික්කයේ අම්බොක්ක ප්‍රදේශයේ පිහිටි අම්බොක්ක දේවාලය පත්තිනි දේවිය උදෙසා ඉදිවූ තවත් සුවිශේෂී එහෙත් අප්‍රසිද්ධ දේවාලයකි. එම දේවාලයෙහි ආරම්භය කවර කලෙක සිදුවූවක්ද යන ගැටළුව පාදක කොට ගෙන ඒ පිළිබඳව වාස්තුවිද්‍යාත්මක විමර්ශනයක් සිදු කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණයි. මෙම දේවාලය පිළිබඳව කිසිදු සාහිත්‍ය මූලාශ්‍රයක තොරතුරු සඳහන් නොවේ. ජනප්‍රවාදවලට අනුව මෙම දේවාලය දෙවන විමලධර්මසූරිය රජු කරවූ බවත්, එසේම 1767 රාජසිංහ රජුගේ කාලයේ මෙම දේවාලය තිබුනු බවත් ජනප්‍රවාදවල සඳහන් වේ. රජතුමාගේ බිසවට උදරයේ ආසාදනයක් ඇති වීම හේතුවෙන් එය සුව කර ගැනීම සඳහා රජු සහ බිසව මෙම දේවාලයට පැමිණි බව සඳහන් වේ. ජනප්‍රවාදයේ හැර කිසිදු ස්ථානයක එම පුවත සඳහන් නොවේ. මෙහි ඇති පුරාවිද්‍යාත්මක සාධක පෞරාණික දේවාලයක් බවට තොරතුරු සනාථ කරයි. මෙම දේවාල ගෘහයට පිවිසෙන දොරටුව වටා ඇති චිත්‍ර මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය නිරූපණය කරයි. මහනුවර යුගයේ චිත්‍රවල දැකිය හැකි අන්දමේ මකර තොරණක් මෙහි දොරටුව වටා නිරූපිතය. එහි දොරටුව දෙපස පුන්කලස් දෙකක් අතින් ගත් දේව ප්‍රතිමා දෙකක් දක්නට තිබේ. එම ප්‍රතිමා දෙකට පසුපස හක්ගෙඩිය පිඹින කලාකරුවන් දෙදෙනෙකුගේ සිතුවම් නිරූපිතය. දොරටුව දෙපස නෙළුම් මල් පේළියක් ආකාරයට පහළ සිට ඉහළට විහිදෙන අයුරින් සිතුවමට නගා තිබේ. දොරටුවට ඉහළින් තවත් ප්‍රතිමා හයක් ඉදි කර වර්ණ භාවිතයෙන් අලංකාරවත් කර ඇත. එම ප්‍රතිමාවලට ඉහළින් ඉර, හඳ යන සංකේත සිතුවමට නගා තිබේ.. මෙම සිතුවම් සියල්ලම මහනුවර යුගයේ චිත්‍රණය කරන ලද සිතුවම් ලෙස එහි ඇති චිත්‍ර ශෛලිය, අලංකරණ, වර්ණ භාවිතය ආදිය මගින් පෙන්වා දිය හැකිය.. එහි ලියවැල් මෝස්තර, පලා පෙති සහ නෙළුම් මල් මෝස්තර සුලභව දැකගත හැකිය. හුණු බදාමයක් මත මෙහි සිතුවම් චිත්‍රණය කර තිබේ. එහි දොර දැවයෙන් ඉදිකර ඇති අතර එයද විවිධ අලංකරණවලින් යුක්තය. දේවාල ගෘහයෙහි ඉදිරිපස සීමාව ගල් කණු මත ඉදි කර ඇත. එහි පේකඩ, පරාල ආදී සියල්ලම දැවයෙන් ඉදි කර වහලය සඳහා පෙති උළු සෙවිලි කර ඇත. දැව ආධාරයෙන් ඉදි කරන ලද කොටසෙහි විවිධ ලියවැල්, මල් මෝස්තර කැටයමට නගා ඇත. මෙම පෞරාණික නටබුන් පරීක්ෂා කිරීමේදී මෙම දේවාලය ඉදි කර ඇත්තේ මහනුවර යුගයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව බව පැහැදිලි වේ.

අම්බොක්ක පත්තිනි දේවාලය අසල මහනුවර යුගයට අයත් පැරණි අම්බලමක් දක්නට ඇත. ප්‍රමාණයෙන් කුඩා සම සතරැස් ආකාරයෙන් නිම කල අම්බලමේ පියස්ස ගල් කණු හතරක් මත ඉදි කර ඇත. තිරස්ව තැබූ තවත් කුලුණු හතරක හිඳ ගැනීමට පිල සකසා ඇත. එහි වහලය පුරාණයේ පෙති උළු සෙවිලි කර තිබූ බව සඳහන් වේ. එම අම්බලම අවුරුදු 300ක් පමණ පැරණි බව සඳහන් වේ. ඒ අනුව එම අම්බලම මහනුවර යුගයට අයත් බව සඳහන් කළ හැක. මෙය වර්තමානයෙහිද ඉතාමත් සුරක්ෂිතව දක්නට ඇත.

**සමාලෝචනය**

මේ අනුව දැනට හඳුනාගත හැකි සාධක ආධාරයෙන් අම්බොක්ක පත්තිනි දේවාලය මහනුවර යුගයේ දී ඉදි කරන ලද ඉතාමත් උසස් වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවලින් යුත් දේවාලයක් බව සනාථ කොට ගත හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**සම්මුඛ සාකච්ඡා**

වෙත්තසිංහ, ඩබ්ලිව්.ඩී. (2024). අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳව. එච්. ඒ. එස්. එම්. හෙට්ටිආරච්චි, 2024.12.22

චන්දන, ආර්.එම්. (2024). අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳව. එච්. ඒ. එස්. එම්. හෙට්ටිආරච්චි, 2024.12.22

වලිසුන්දර, රයන් දනුෂ්ක. (2024). අම්බොක්ක පත්තිනි දේවාලය පිළිබඳව. එච්. ඒ. එස්. එම්. හෙට්ටිආරච්චි, 2024.12.22